# කැලණිය විශ්වවිද්‍යාලය-ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි

තෙවන පරීක්ෂණය (බාහිර) - 2008

## BMGT 33025 – කුඩා ව්‍යාපාර කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(01) (අ) "විවිධ පුද්ගලයින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විවිධාකාරයෙන් නිර්වචනය කරයි."
විවිධ නිර්වචන භාවිතා කරමින් ඔබගේ පිළිතුර විස්තර කරන්න.
(ලකුණු 06)

(ආ) කුඩා කර්මාන්තයන්හි ගති ලක්ෂණ පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(ඇ) "කුඩා හා මහා පරිමාණ ව්‍යාපාර සංවිධාන අතර වෙනසක් නැත." ඔබ ඉහත ප්‍රකාශය සමග එකගවන්නේද? ඔබේ ස්ථාවරය පැහැදිලි කරන්න.
(ලකුණු 08)
(මුළු ලකුණු 20)

(02) (අ) "රටක ආර්ථික සංවර්ධනයට කුඩා ව්‍යාපාර ආයතන විශාල දායකත්වයක් ලබා දෙයි." ශ්‍රී ලංකාව ඇසුරින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.
(ලකුණු 10)

(ආ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි අසමාර්ථයන් මොනවද?
(ලකුණු 05)

(ඇ) රටක් වශයෙන්, ඉහත අසමාර්ථයන් සඳහා විසඳුම් මොනවාද?
(ලකුණු 05)
(මුළු ලකුණු 20)

(03) (අ) "ව්‍යවසායකයෙකු" යනු කවරෙක්ද? නිර්වචනය කරන්න.
(ලකුණු 08)

(ආ) "ව්‍යවසායකයන් විශේෂිත පුද්ගලයන් වේ." ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද? පහදන්න.
(ලකුණු 12)
(මුළු ලකුණු 20)

(04) (අ) ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රය යනු කුමක්ද?
(ලකුණු 08)

(ආ) ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ පිළිවෙලකට බලපාන මූලික සාධක මොනවාද? ශ්‍රී ලංකාවේ, ව්‍යාපාරික පරිසරය ඇසුරින් විග්‍රහ කරන්න.
(ලකුණු 12)
(මුළු ලකුණු 20)

(05) නුවන් ගම්පහ නගරයේ පදිංචි අ.පො.ස. (උසස්) පෙළ දක්වා උගත් තිස් හැවිරිදි තරුණයෙකි. පාසැල් අධ්‍යාපනයෙන් පසු ඔහු පෞද්ගලික සමාගමකට අයත් අහාරපාන අලෙවි සැලක කළමනාකරුවෙකු වශයෙන් වසර පහක් සේවය කළේය. ව්‍යාපාරයක් ඇරඹීමට ඇති දැඩි අශාව නිසාම රැකියාවෙන් ඉවත් වී ලබන වසරේ මුල්භාගයේ දී සිය ව්‍යාපාරය ඇරඹීමට අපේක්ෂාවෙන් සිටියි.

මේ වන විට ඔහු රැකියාවෙන් උපයාගත් රු. 250,000/- ක මුදලක් බැංකුවෙහි ගිණුමක තැන්පත් කර ඇති අතර. පියා විසින් ලබා දුන් ගම්පහ නගර සීමාවේ පිහිටි පර්චස් 20ක බිම් කැබැල්ලෙහි ගොඩනැගිල්ලක් ඉදි කරමින් සිටියහ. මෙම ඉඩම ආසන්නයේ රජයේ කාර්යාල. පාසැල් සහ ප්‍රධාන රෝහලද පිහිටා ඇත. නුවන් ව්‍යාපාර අවස්ථා කිහිපයක්ම සලකා බලා ඇති අතර ඒවා පහත පරිදි වේ.

- හෝටලයක් සහ බේකරියක්
- කිරි හලක් සමග ස්නැක් බාර්හලක්
- සිල්ලර අලෙවි සැලක්
- මල් ශාලාවක්
- බෙහෙත් ද්‍රව්‍ය අලෙවි සැලක් (ෆාමසි)
- පොත් සහ ලිපි ද්‍රව්‍ය අලෙවි සැලක්

මේවා අතුරින් සුදුසු ව්‍යාපාරයක් තෝරා ගැනීම සඳහා ඔහු සලකා බැලිය යුතු කරුණු මොනවාදැයි. ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ඇසුරින් පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 20)

(06) යෝජිත කුඩා පරිමාණ ව්‍යාපාරයක් සඳහා සුදුසු උපකල්පන භාවිතා කරමින් ශක්‍යතා වාර්තාවක් සකස් කරන්න.

(මුළු ලකුණු 20)